# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1942/11 - 2015 නොවැම්බර් මස 24 වැනි අඟහරුවාදා - 2015.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 104/44.

**භාර ආඥාපනත (87 වැනි අධිකාරය)**

114 වැනි වගන්තිය යටතේ නියමය

''විෂ් ෆවුන්ඩේෂන් භාරය'' යන භාරයේ භාරකරුවන්, එනම් -

1. ජයන්ත මිහිර වික්‍රමාරච්චි
2. ටානියා රසාංගි වික්‍රමාරච්චි
3. එරන්ති ලීසා වික්‍රමාරච්චි
4. ධම්මික කිතුල්ගොඩ

විසින්, (87 වැනි අධිකාරය වූ) භාර ආඥාපනතේ 114 වැනි වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබීම සඳහා අධිකරණ අමාත්‍යවරයා වෙත ඉල්ලුම්කර ඇති හෙයින් ;

ඉහත කී වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ අමාත්‍ය විජයදස රාජපක්ෂ වන මම, එකී භාරකරුවන් සංස්ථාගත කිරීමට මේ නියමයෙන් බලය දෙන අතර -

(අ) එකී භාරයේ රීති යටතේ සහ කොළඹ, ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඩබ්ලිව්. එම්. පී. රාජකරුණා විසින් සහතික කරන ලද 2012 අප්‍රේල් මස 04 වැනි දින අංක 264 දරන භාර ප්‍රකාශනය යටතේ යථා පරිදි පත් කරන ලද ඉහත නම් සඳහන් භාරකරුවන් සහ ඔවුනගේ තත්කාලීන අනුප්‍රාප්තිකයන් ''විෂ් ෆවුන්ඩේෂන් භාරය'' යන නාමය සහ අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු යයි ද ;

(ආ) එකී භාරකරුවන් විසින්, එකී නාමය සහ අභිධානය යටතේ කවර හෝ විස්තරයකට අයත් චංචල හෝ නිශ්චල දේපළ, එකී භාරය වෙනුවෙන් මිලදී ගැනීම, භාර ගැනීම, දැරීම, ණයට ගැනීම හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම, විකිණීම, හුවමාරු කිරීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, බදු දීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම කළ හැකි යයි ද ; සහ



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) එකී භාරයට අදාළව පැන නඟින සියලු නඩු නිමිත්තිවල දී සහ නඩුවල දී ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත කවර හෝ අධිකරණයක දී එකී නාමයෙන් සහ අභිධානයෙන් එකී භාරකරුවන් විසින් නඩු පැවරීමට සහ පවරනු ලැබීමට ද, උත්තර දීමට සහ උත්තර දෙනු ලැබීමට ද, විත්තිවාචක ඉදිරිපත් කිරීමට සහ විත්තිවාචක ඉදිරිපත් කරනු ලැබීමට ද නීතියෙහි ලා හැකියාව හා බලය ඇත්තේ යයි ද,

විධාන කර ප්‍රකාශ කරමි.

මේ නියමය ප්‍රත්‍යාදිෂ්ට කිරීම, නැතහොත් අවශ්‍ය යයි මට පෙනී යන ආකාරයකින් එය කලින් කල වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම, මා විසින් කරනු ලැබිය හැකි ය.

විජයදාස රාජපක්ෂ,<br>
අධිකරණ අමාත්‍ය.

2015 නොවැම්බර් මස 06 වැනි දින,<br>
කොළඹ,

12-352

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.